මහවැලි, කෘෂිකර්ම, වාරිමාර්ග සහ ග්‍රාමීය සංවර්ධන අමාත්‍යාංශය
மகாவலி ,கமத்தொழில், நீர்ப்பாசனம் மற்றும் கிராமிய அபிவிருத்தி அமைச்சு
Ministry of Mahaweli, Agriculture, Irrigation and Rural Development

(කෘෂිකර්ම අංශය / விவசாயப் பிரிவு / Agriculture Division)

80/5, "ගොවිජන මන්දිරය", රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල.
80/5, "கொவிஜன மந்திரய", ராஜமல்வத்தை வீதி, பத்தரமுல்லை.
80/5, "Govijana Mandiraya", Rajamalwatte Avenue, Battaramulla, Sri Lanka.


මගේ අංකය. / எனது இல. / My No. 4.3/SEED/2020 Yala
ඔබේ අංකය. / உமது இல. / Your No.
දිනය. / திகதி. / Date. 2020.04.24

ප්‍රධාන ලේකම්, ............................. පළාත
දිස්ත්‍රික් ලේකම් / දිසාපති, .......................
කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්
ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්
අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය

<u>කඩිනම් මධ්‍ය කාලීන ආහාර නිෂ්පාදන ජාතික වැඩසටහන යටතේ අතිරේක ආහාර බෝග වගාකරන ගොවීන්ට බීජ සඳහා සහන සැලසීම ක්‍රියාත්මක කිරීම සඳහා උපදෙස්</u>

අතිරේක ආහාර බෝග නිෂ්පාදනය දිරිගැන්වීම සඳහා 2020 යල කන්නයේ ( මාර්තු 15 සිට සිට සැප්තැම්බර් 30 දක්වා) වගා කරනු ලබන බෝගවල බීජ ලබාදීම සඳහා අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 20/0682/217/036 හා 2020 අප්‍රේල් මස 09 වන දින ලබාදුන් තීරණය පරිදි ක්‍රියාත්මක කරන ලෙස කාරුණිකව දන්වමි. බීජ ලබාදීමේදී ක්‍රියාත්මක කරන ක්‍රමවේදය පහත පරිදි වේ.

ආවරණය වන බෝග

බඩඉරිඟු, මුං, උඳු, කොල්ලු, සෝයා, කව්පි, තල, රටකජු, කුරක්කන්, ලොකුළූණු, රතුළූණු, මිරිස්, අර්තාපල්, කහ, ඉඟුරු, සුදුළූණු

ලබා දෙනු ලබන සහන

එක් බෝගයක් සඳහා ආරම්භක අක්කර ½ දක්වා බීජ සඳහා වියදම රජය විසින් සම්පූර්ණයෙන්ම දරන අතර, එයට වඩා වගා කරන්නේ නම් උපරිම අක්කර 5 දක්වා බීජ වලට වැයවන මුදලින් 50% ක් රජය විසින් දරනු ඇත. ඒ අනුව 50% දායකත්වය රජය විසින් දරනු ලබන්නේ එම බෝගය සඳහා අක්කර 4 ½ ක් සඳහා පමණි.

එකම ගොවියෙකු ඉහත බෝග වලින් ඉහත අවශ්‍යතාවය සපුරමින් බෝග කීපයක් වගා කරන අවස්ථාවේදී සෑම බෝගයක් සඳහාම මෙම සහනය හිමිවේ.

මෙම සහනය හිමිවීම සඳහා අවම ලෙස අක්කර 1/4 වගා වපසරියක්වත් තිබිය යුතුය. බෝග වර්ග කිහිපයකින් මෙම ප්‍රමාණය (අක්කර 1/4 ) වගා කර ඇති විටද මෙම සහනය හිමි නොවේ.




ලේකම් / செயலாளர் / Secretary — දුරකථන / தொலைபேசி / Telephone - 011-2879048; ඊ-මේල් / மின்னஞ்சல் / e- mail - secretary@agrimin.gov.lk; ෆැක්ස් / தொலைநகல் / Fax - 011-2863497
කාර්යාලය / அலுவலகம் / Office — දුරකථන / தொலைபேசி / Telephone - 011-2872093, 011-2872097; ඊ-මේල් / மின்னஞ்சல் / e- mail - info@agrimin.gov.lk; ෆැක්ස් / தொலைநகல் / Fax - 011-2868910

ඉඩමේ හිමිකාරිත්වය මත නොව වගා කළ පසු වගා වපසරිය හා වගාකරු සැලකිල්ලට ගෙන ගෙවීම සිදු කරනු ලැබේ.

ගෙවීම සඳහා සුදුසුකම් ලබන ආකාරය

1. වගාව ආරම්භ කළ වහාම ප්‍රදේශයේ කෘෂිකර්ම උපදේශක කාර්යාලයේ/ මහවැලි ඒකක කළමණාකාර කාර්යාලයේ, කෘෂිකර්ම උපදේශක /ඒකක කළමණාකරු වෙත පහත තොරතුරු ලබාදී වගාකරු ලියාපදිංචි වී යුතුය. ( වගාකරුගේ නම, ජාතික හැදුනුම්පත් අංකය, බෝග/බෝගය, වගා වපසරිය, භාවිතා කළ බීජ ප්‍රමාණය (කි.ග්‍රෑ), ස්ථිර ලිපිනය, වගාව පිහිටුවා ඇති ස්ථානය සහ භූගෝලීය පිහිටීම (GPS)

2. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන්, පෞද්ගලික අංශයෙන්, තමා විසින් සපයා ගත් හෝ ගොවීන් විසින් හුවමාරු කරගන්නා බීජ යන කුමන ආකාරයකින් බීජ සපයා ගෙන අදාල වපසරියේ ප්‍රමාණවත් පැල ගහනයක් පවත්වා ගත යුතුය. සිටුවන ලද බීජ වල පන්තිය නොසලකා ඇමුණුම අංක 1 හි සඳහන් මිළගණන් අනුව ගෙවීම් සිදුකළ යුතුය.

කෘෂිකර්ම උපදේශක/ මහවැලි ශෂ්‍ය විද්‍යාඥ විසින් ගෙවීම සඳහා ක්ෂේත්‍ර නිරීක්ෂනය මගින් පහත කරුණු තහවුරු කළ යුතුය.

1. ලේඛනයේ සඳහන් භූමි ප්‍රමාණයම වගාකර තිබේද යන්න.

2. නියමිත භූමි ප්‍රමානයට අනුකූල අස්වැන්නක් ලබාගත හැකිවන පරිදි ප්‍රමාණවත් පැල ගහණයක් තිබේද යන්න

3. වගාව නිසි පරිදි නඩත්තුකර තිබේද යන්න.

4. ප්‍රරෝහනයේදී හෝ වෙනත් වගා හානියක් හේතුවෙන් නිරීක්ෂණය කරන අවස්ථාවේදී ලියාපදිංචි ඇති වගා වපසරියට වඩා අඩු වගා වපසරියක් තිබේනම් එම ප්‍රමාණයට ගෙවීම් කළ යුතුයි.

5. තම බල ප්‍රදේශයේ සියළු වගා කරුවන්ගේ වගාව පිහිටුවීමෙන් අනතුරුව මාසයක් ඇතුලත ගෙවීම් සඳහා නිර්දේශ කර නිරීක්ෂණ ලබාදිය යුතුයි.

6. සියළුම මුදල් හෝ චෙක්පත් ගොවියා පදිංචි ස්ථානයට ගොස් අදාල නිලධාරියා විසින් ගෙවීම් කළ යුතුය.

ගෙවීම් වවුචර්පත් පිලියෙල කිරීම

කෘෂිකර්ම උපදේශක විසින් වවුචර්පත් පිළියෙල කර සිය නිර්දේශය සහිතව කලාප භාර සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ මගින් දිස්ත්‍රික් භාර නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ වෙත නොපමාව ඉදිරිපත් කළ යුතුය.

මහවැලි බල ප්‍රදේශවලදී ඒකක කළමණාකරු විසින් පිළියෙල කර මහවැලි ශෂ්‍ය විද්‍යාඥගේ නිර්දේශ සහිතව නේවාසික ව්‍යාපාර කළමණාකරු (කෘෂිකර්ම) වෙත ඉදිරිපත් කළ යුතුය. නේවාසික ව්‍යාපාර කළමණාකරු (කෘෂිකර්ම) විසින් එම බල ප්‍රදේශයේ නේවාසික ව්‍යාපාර කළමණාකාරු වෙත සිය නිර්දේශය සහිතව ඉදිරිපත් කළ යුතුය.

ගොවියා විසින් බීජ මිලදී ගෙන හෝ සපයා ගෙන ඇති විට අදාල සහනාධාරයම මුදල් මගින් හෝ චෙක්පත් මගින් ගොවියා වෙතම ගෙවිය යුතුය. ගොවියා ණය පදනම මත කෘෂිකර්ම

දෙපාර්තමේන්තුවෙන්, පලාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන් හෝ ශ්‍රී ලංකා මහවැලි අධිකාරියෙන් ණය පදනම මත බීජ ලබාගෙන ඇත්නම් එම සහනාධාර මුදල අදාල ආයතනයට ගෙවිය යුතුය.

මෙම වැඩසටහන සඳහා වියදම් වේ යැයි අපේක්ෂිත වියදම ඇස්තමේන්තුගත කිරීම ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, පලාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තු හා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් සිදුකර 2020 මැයි මස 15 දිනට පෙර කෘෂිකර්ම අමාත්‍යාංශය වෙතට ඉදිරිපත් කල යුතුය. එම ඇස්තමේන්තු කෘෂිකර්ම අමාත්‍යාංශයේ වෙතට කලට වෙලාවට ඉදිරිපත් කිරීම ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ අධ්‍යක්ෂ කෘෂිකර්ම වෙතටත්, ඒ ඒ පලාත් කෘෂිකර්ම දෙපාර්තුමේන්තුවල පලාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ වරුන් හා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ (ව්‍යාප්ති හා පුහුණු) වෙත පැවරෙනු ඇත.

ඉදිරිපත් කළ ඇස්තමේන්තුවලට අනුව කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, පලාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවලටත්, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවටත් ප්‍රතිපාදන ලබාදෙනු ලැබේ. මෙම සහනාධාර මුදල් 2020 අගොස්තු 15 වෙනි දිනට පෙර ගොවීන් වෙත ගෙවා අවසන්කල යුතුයි.

නීල් බණ්ඩාර හපුහින්න
ලේකම්
මහවැලි, කෘෂිකර්ම, වාරිමාර්ග හා ග්‍රාමීය සංවර්ධන අමාත්‍යාංශය

පිටපත්

1. පළාත් ආණ්ඩුකාරතුමා, ………………… පළාත - කාරුණික දැන ගැනීම සඳහා
2. පලාත් කෘෂිකර්ම ලේකම්, ………………… පළාත්- කාරුණික දැන ගැනීම සඳහා
3. අධ්‍යක්ෂ ජනරාල්, වාරිමාර්ග දෙපාර්තමේන්තුව - කාරුණික දැන ගැනීම සඳහා
4. අධ්‍යක්ෂ (වාරි කළමනාකරණ අංශය) - කාරුණික දැන ගැනීම සඳහා
5. පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ, ………………… පළාත - අවශ්‍ය කටයුතු සඳහා
6. දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂ, ………………… - අවශ්‍ය කටයුතු සඳහා

# Proposed Seeds/ Planting Material Subsidy Programme for 2020 Yala

| | | 1 | | | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| Crop | | Maize ( Hybrid) | Maize (DOA Hybrid) | Maize( OPV) | Chilli | Green gram | Finger millet | Ground nut | Cowpea | Red onion | Black gram | Soya | Big onion | Gingerly |
| Seed Rate (Kg/ha) | | 12.5 | 12.5 | 20 | 1 | 30 | 6 | 100 | 30 | 1500 | 30 | 50 | 6 | 7 |
| Price Rs /kg | | 1300 | 800 | 230 | 5000 | 330 | 250 | 340 | 300 | 250 | 380 | 220 | 14000 | 680 |
| Full Subsidy | 0.25 Ac | 1625 | 1000 | 460 | 500 | 990 | 150 | 3400 | 900 | 37500 | 1140 | 1100 | 8400 | 476 |
| | 0.5Ac | 3250 | 2000 | 920 | 1000 | 1980 | 300 | 6800 | 1800 | 75000 | 2280 | 2200 | 16800 | 952 |
| Subsidy With 50% Farmer Contribution Rs. | 0.25 Ac | 812.5 | 500 | 230 | 250 | 495 | 75 | 1700 | 450 | 18750 | 570 | 550 | 4200 | 238 |
| | 0.5 Ac | 1625 | 1000 | 460 | 500 | 990 | 150 | 3400 | 900 | 37500 | 1140 | 1100 | 8400 | 476 |
| | 0.75 Ac | 2437.5 | 1500 | 690 | 750 | 1485 | 225 | 5100 | 1350 | 56250 | 1710 | 1650 | 12600 | 714 |
| | 1 Ac | 3250 | 2000 | 920 | 1000 | 1980 | 300 | 6800 | 1800 | 75000 | 2280 | 2200 | 16800 | 952 |
| | 1.25 Ac | 4062.5 | 2500 | 1150 | 1250 | 2475 | 375 | 8500 | 2250 | 93750 | 2850 | 2750 | 21000 | 1190 |
| | 1.5 Ac | 4875 | 3000 | 1380 | 1500 | 2970 | 450 | 10200 | 2700 | 112500 | 3420 | 3300 | 25200 | 1428 |
| | 1.75 Ac | 5687.5 | 3500 | 1610 | 1750 | 3465 | 525 | 11900 | 3150 | 131250 | 3990 | 3850 | 29400 | 1666 |
| | 2 Ac | 6500 | 4000 | 1840 | 2000 | 3960 | 600 | 13600 | 3600 | 150000 | 4560 | 4400 | 33600 | 1904 |
| | 2.25 Ac | 7312.5 | 4500 | 2070 | 2250 | 4455 | 675 | 15300 | 4050 | 168750 | 5130 | 4950 | 37800 | 2142 |
| | 2.5 Ac | 8125 | 5000 | 2300 | 2500 | 4950 | 750 | 17000 | 4500 | 187500 | 5700 | 5500 | 42000 | 2380 |
| | 2.75 Ac | 8937.5 | 5500 | 2530 | 2750 | 5445 | 825 | 18700 | 4950 | 206250 | 6270 | 6050 | 46200 | 2618 |
| | 3 Ac | 9750 | 6000 | 2760 | 3000 | 5940 | 900 | 20400 | 5400 | 225000 | 6840 | 6600 | 50400 | 2856 |
| | 3.25 Ac | 10562.5 | 6500 | 2990 | 3250 | 6435 | 975 | 22100 | 5850 | 243750 | 7410 | 7150 | 54600 | 3094 |
| | 3.5 Ac | 11375 | 7000 | 3220 | 3500 | 6930 | 1050 | 23800 | 6300 | 262500 | 7980 | 7700 | 58800 | 3332 |
| | 3.75 Ac | 12187.5 | 7500 | 3450 | 3750 | 7425 | 1125 | 25500 | 6750 | 281250 | 8550 | 8250 | 63000 | 3570 |
| | 4 Ac | 13000 | 8000 | 3680 | 4000 | 7920 | 1200 | 27200 | 7200 | 300000 | 9120 | 8800 | 67200 | 3808 |
| | 4.25 Ac | 13812.5 | 8500 | 3910 | 4250 | 8415 | 1275 | 28900 | 7650 | 318750 | 9690 | 9350 | 71400 | 4046 |
| | 4.5 Ac | 14625 | 9000 | 4140 | 4500 | 8910 | 1350 | 30600 | 8100 | 337500 | 10260 | 9900 | 75600 | 4284 |

| Crop | | 12 | 13 | 14 | 15 |
|---|---|---|---|---|---|
| | | Kollu | Potato | Ginger | Termaric |
| Seed Rate (Kg/ha) | | 25 | 2000 | 1250 | 1500 |
| Price Rs /kg | | 400 | 200 | 100 | 100 |
| Full Subsidy | 0.25 Ac | 1000 | 40000 | 12500 | 15000 |
| | 0.5Ac | 2000 | 80000 | 25000 | 30000 |
| | | | | | |
| Subsidy With 50% Farmer Contribution Rs. | 0.25 Ac | 500 | 20000 | 6250 | 7500 |
| | 0.5 Ac | 1000 | 40000 | 12500 | 15000 |
| | 0.75 Ac | 1500 | 60000 | 18750 | 22500 |
| | 1 Ac | 2000 | 80000 | 25000 | 30000 |
| | 1.25 Ac | 2500 | 100000 | 31250 | 37500 |
| | 1.5 Ac | 3000 | 120000 | 37500 | 45000 |
| | 1.75 Ac | 3500 | 140000 | 43750 | 52500 |
| | 2 Ac | 4000 | 160000 | 50000 | 60000 |
| | 2.25 Ac | 4500 | 180000 | 56250 | 67500 |
| | 2.5 Ac | 5000 | 200000 | 62500 | 75000 |
| | 2.75 Ac | 5500 | 220000 | 68750 | 82500 |
| | 3 Ac | 6000 | 240000 | 75000 | 90000 |
| | 3.25 Ac | 6500 | 260000 | 81250 | 97500 |
| | 3.5 Ac | 7000 | 280000 | 87500 | 105000 |
| | 3.75 Ac | 7500 | 300000 | 93750 | 112500 |
| | 4 Ac | 8000 | 320000 | 100000 | 120000 |
| | 4.25 Ac | 8500 | 340000 | 106250 | 127500 |
| | 4.5 Ac | 9000 | 360000 | 112500 | 135000 |

## කඩිනම් මධ්‍ය කාලින ජාතික ආහාර නිෂ්පාදන වැඩසටහන යටතේ අතිරේක ආහාර බෝග වගා කරන ගොවීන්ට බීජ ලබා දීම සඳහා සහන ලබා දීම 2020 යල

වගාකරුගේ නම :
ලිපිනය :
ජාතික හැඳුනුම් පත් අංකය:
දුරකථන අංකය :
බෝගය :
කෘෂිකර්ම උපදේශක බල ප්‍රදේශය/ මහවැලි කොට්ඨාශ කළමනාකාර බල ප්‍රදේශය :
ගොවිජන සේවා බල ප්‍රදේශය :
සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ කලාපය :
දිස්ත්‍රික්කය :
ගොවිපල පිහිටි ස්ථානය :

ඉහත ලිපිනයේ පදිංචි නම් සඳහන් මා ............................බෝගය ඉහත ගොවිපල පිහිටි ස්ථානයේ අක්කර ................ක්, මා විසින්, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන් (ණය පදනමට/ මිලදී ගත් )/ පුද්ගලික අංශයෙන් / පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන් /ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය මගින් /මා විසින් ගුනනය කල / මා හිතවත් ගොවිමහතෙකුගෙන් ඉල්ලා ගත් බීජ කිලෝ ග්‍රෑම් ................. ක් භාවිතා කර වගා කර ඇති බව සහතික කරමි.

.......................................................
අත්සන
නම:

---

කෘෂිකර්ම උපදේශකගේ /ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ කොට්ඨාශ කළමනාකරු ගේ නිර්දේශය :

ඉහත ලිපිනයේ පදිංචි නම සඳහන් ගොවි මහතා විසින් ............................බෝගය ඉහත ගොවිපල පිහිටි ස්ථානයේ අක්කර ................ක්, *ඔහු විසින් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන් (ණය පදනමට/ මිලදී ගත් ) / පුද්ගලික අංශයෙන් / පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන් /ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය මගින් / ඔහු විසින් ගුනනය කල / ඔහු හිතවත් ගොවිමහතෙකුගෙන් ඉල්ලා ගත්* බීජ කිලෝ ග්‍රෑම් .................ක් භාවිතා කර වගා කර ඇති බවත්. එම ගොවිපල මා විසින් පුද්ගලිකව නිරීක්ෂණය කල අතර නියමිත පැල ගහනය *ඇති බවත් / පැලගහනය නොමැති* බවත් ඉහත ඔහු විසින් ඉල්ලා ඇති *බීජ ප්‍රමාණය /බීජ ප්‍රමාණයෙන් 50% / සංශෝධිත ................බීජ කිලෝ ග්‍රෑම් ප්‍රමාණයක් සඳහා* රු ...................ක් ගෙවීම සුදුසු බව සහතික කරමි

ඔහු විසින් මෙම බීජ *කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන්/ පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන් /ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය මගින්* ණය පදනමට ලබා ගෙන ඇති බැවින් මෙම මුදල *කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට /ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය ට* බැර කරන ලෙසද ඉල්ලමි.

දිනය .................................

කෘෂිකර්ම උපදේශක/
කොට්ඨාශ කළමනාකරු

කඩිනම් මධ්‍ය කාලින ආහාර නිෂ්පාධන වැඩසටහන යටතේ අතිරේක ආහාර බෝග වගා කරන ගොවීන්ට
බීජ ලබා දීම සඳහා සහන ලබා දීම 2020 යල
කෘෂිකර්ම උපදේශක/ මහවැලි කොට්ටාශ කළමනාකර කොට්ටාශ මට්ටමින් ගොවීන් ලියාපදිංචි කිරීම.

බෝගය :
කෘෂිකර්ම උපදේශක බල ප්‍රදේශය/ මහවැලි කොට්ටාශ කළමනාකර බල ප්‍රදේශය :
ගොවිජන සේවා බල ප්‍රදේශය :
සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ කලාපය :
දිස්ත්‍රික්කය :

| අනු අංකය | වගාකරු ගේ නම | ලිපිනය | ජාතික හැඳුනුම්පත් අංකය | දුරකථන අංකය | වගා කල වපසරිය (අක්කර) | වගා කල බීජ ප්‍රමාණය (kg) | වගාව පිහිටුවා ඇති ස්ථානය |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |